**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

**විශ්වවිද්‍යාලය ප්‍රවේශය – 2026/2027**

**සාමාන්‍ය ප්‍රවේශය**

**අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා විස්තර/උපදෙස්**

ඉතා වැදගත්: මෙහි සඳහන් උපදෙස් හොඳින් කියවා බැලීමෙන් අනතුරුව තම අයදුම්පත සම්පූර්ණ කරන ලෙස සියලු ම අයදුම්කරුවන්ට මෙයින් තරයේ උපදෙස් දෙනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග):

උදා :- (පැවිදි අපේක්ෂකයෙක් නම්) රේවත, බී.

(ගිහි අපේක්ෂකයෙක් නම්) බණ්ඩාර, එම්.එම්.කේ.

මුලකුරුවලින් හැඳින්වෙන නම්:

(පැවිදි අපේක්ෂකයෙක් නම්) බිබිලේ

(ගිහි අපේක්ෂකයෙක් නම්) මොරමුලේ මුදියන්සේලාගේ කුමාර

සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්):

(පැවිදි අපේක්ෂකයෙක් නම්) BIBILE REVATHA

(ගිහි අපේක්ෂකයෙක් නම්) MORAMULE MUDIYANSELAGE

KUMARA BANDARA

ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න.

2. ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය සඳහන් කරන්න.

ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් කරන්න.

දුරකථන අංකය සඳහන් කරන්න.

ඉහත ලිපිනයෙහි පදිංචි කාලය සඳහන් කරන්න.

ඔබ අයත් පරිපාලන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

3. අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා විෂයන් නිවැරදි ව පිළිවෙළින් සඳහන් කරන්න. අ.පො.ස. (උ.පෙළ) සමත් වර්ෂය නිවැරදි ව සටහන් කරන්න.

2022, 2023, 2024 අ.පො.ස (උ.පෙළ) හෝ 2025 අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි පරිපාලන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

| පරිපාලන දිස්ත්‍රික්කය | අංකය | පරිපාලන දිස්ත්‍රික්කය | අංකය | පරිපාලන දිස්ත්‍රික්කය | අංකය |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | හම්බන්තොට | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | පුත්තලම | 18 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කළුතර | 03 | කිලිනොච්චි | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිව් | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වව්නියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොනරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| රත්නපුර | 25 | | | | |

4. ප්‍රාචීන මධ්‍යම විභාගයේ ප්‍රතිඵල හා විෂයයන් නිවැරදි ව සඳහන් කරන්න.
5. අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පාලි භාෂාව විෂයක් ලෙස හදාරා නොමැති අය පාලි භාෂා විෂයට අදාළ සුදුසුකම් සඳහන් කරන්න.
6. ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයේ ප්‍රතිඵල හා විෂයයන් නිවැරදි ව සඳහන් කරන්න.
7. විද්‍යෝදය හා විද්‍යාලංකාර අවසාන විභාගයේ ප්‍රතිඵල, විෂයයන් නිවැරදි ව සඳහන් කරන්න.
8. උපන් දිනය, ස්ථානය සහ 2026.05.11 දිනට වයස සඳහන් කරන්න.
ස්ත්‍රී/පුරුෂ භාවය සහ විවාහක/අවිවාහක භාවය සඳහන් කරන්න.
ජාතිය සහ ආගම සඳහන් කරන්න.
9. ඔබ වහන්සේ අයත් නිකාය හා පාර්ශ්වය සඳහන් කරන්න.
10. ගුරු හිමියන්ගේ හෝ භාරකරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය සඳහන් කරන්න.
11. රැකියාවක් ඇත්නම් සඳහන් කරන්න. සේවා යෝජකයාගේ නම සහ ලිපිනය සඳහන් කරන්න. රැකියාවක් නොමැති නම් ‘‘නැත’’ යනුවෙන් සඳහන් කරන්න.
12. 2022, 2023, 2024 හෝ 2025 වසරට පෙර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත් නම් විමසා තිබෙන සියලු ම තොරතුරු සඳහන් කරන්න. 2022, 2023, 2024 හෝ 2025 වසරට පෙර අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට නැත්නම් ‘‘අදාළ නොවේ’’ යනුවෙන් සඳහන් කරන්න.
13. වෙනත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී ඇත්නම් ‘‘ඔව්’’ යනුවෙන් සඳහන් කොටුවේ ✓ලකුණ යොදා විමසා ඇති සියලු ම තොරතුරු සඳහන් කරන්න. එසේ නැති නම් ‘‘නැත’’ යන කොටුවේ X යොදන්න.
14. ඔබ ප්‍රථම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් ලබා ඇත් නම් ‘‘ඔව්’’ යනුවෙන් සඳහන් කොටුවේ ✓ලකුණ යොදා විමසා ඇති සියලු ම තොරතුරු සඳහන් කරන්න. එසේ නැති නම් ‘‘නැත’’ යන කොටුවේ X යොදන්න.
15. ඔබ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටියේ පාසල්/පිරිවෙන්/පෞද්ගලික අපේක්ෂකයකු ලෙස නම් ඊට අදාළ කොටුව ඉදිරියේ ✓ලකුණ යොදන්න.
16. පාසල්/පිරිවෙන් අපේක්ෂකයින් අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි පාසල/පිරිවෙන පිළිබඳ විස්තරය සපයන්න.
17. පාසල්/පිරිවෙන් අපේක්ෂකයින් වර්ෂ 5කට පෙර ඇතුළත් වූ පාසල්/පිරිවෙන් සඳහන් කරන්න.

18. පෞද්ගලික අපේක්ෂකයින් අධ්‍යාපනය ලැබූ සියලු ම පාසල් හෝ පිරිවෙන් පිළිබඳ විස්තරයක් සඳහන් කළ යුතුය.

19. විශ්වවිද්‍යාලය ප්‍රවේශය සඳහා ඔබ තෝරා ගන්නා භාෂා මාධ්‍යය
(සිංහලෙන් ද/ඉංග්‍රීසියෙන් ද යන්න)

19.1 විෂයන් අනුපිළිවෙළින් සඳහන් කළ යුතු ය.
ඔබ විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලැබුවහොත් ලියාපදිංචි වී සති දෙකකින් පසු ව ප්‍රවේශය සඳහා තෝරා ගත් විෂයයන් වෙනස් කිරීමට අවසර දෙනු නො ලැබේ.

- ❖ පාලි විෂය අනිවාර්ය විෂය වේ. අංක 2 සඳහා බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය යන විෂය දෙකින් එකක් පමණක් තෝරා ගත යුතු ය. අංක 3, 4. 5 සඳහා සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය, බෞද්ධ සමාජ වැඩ, පුරාවිද්‍යාව, බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි, ප්‍රංශ, හින්දි, කොරියන්, ජපන්, දෙමළ, චීන යන විෂයන්ගෙන් 3ක් තෝරා ගත යුතු ය.
- ❖ පාලි සහ බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය යන විෂය දෙක සහිත ව විෂය පහක් පළමු වසර සඳහා තෝරා ගත යුතු ය.
- ❖ පළමු වසරේ දී සිංහල මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන සිසුන් අනිවාර්ය ඉංග්‍රීසි (Compulsory English) සහ බෞද්ධ උපදේශනය ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන සිසුන් මූලික ඉංග්‍රීසි පාඨමාලාව (Preliminary Course in English) සහ බෞද්ධ උපදේශනය ද අනිවාර්ය වේ. උපාධි සහතිකය ලැබීමට මෙම විෂයන් දෙක ම සමත් විය යුතු ය.
- ❖ ප්‍රථම වර්ෂය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශන පැවැත්වෙන්නේ පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය, පුරාවිද්‍යාව (පළමු වසර පමණි), සංස්කෘත, ඉංග්‍රීසි, බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය, බෞද්ධ සමාජ වැඩ, ජපන්, ප්‍රංශ, චීන, කොරියන්, හින්දි, දෙමළ යන විෂයන් සඳහා පමණි.

20. අයදුම්කරුවන්ගේ ප්‍රකාශය හොඳින් කියවා බලා අවබෝධ කොට ගෙන අත්සන සමඟ දිනය යෙදිය යුතු ය. අත්සන සමඟ දිනය හෝ අත්සන හෝ දිනය හෝ නොමැති ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව සියලු ම අපේක්ෂකයන් දත යුතු ය. එම නිසා අයදුම්පත තැපැල් කිරීමට පෙර හෝ භාර දීමට පෙර තම අත්සන සමඟ දිනය යොදා තිබේ ද යන්න නැවත පරීක්ෂා කර බලන ලෙස සියලු ම අපේක්ෂකයන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

21. අ.පො.ස. (උ.පෙළ) විභාගයට පාසලින් පෙනී සිටි අපේක්ෂකයන් තම අයදුම්පත විදුහල්පතිවරයා ලවා ද පිරිවෙන්වලින් පෙනී සිටි අපේක්ෂකයන් තම අයදුම්පත පරිවේණාධිපතීන් වහන්සේ ලවා ද සහතික කරවා ඉදිරිපත් කළ යුතු ය.

22. පෞද්ගලික අයදුම්කරුවන් තම අත්සන සහතික කොට එවිය යුතු ය.

අයදුම්පතෙහි අංක 1 සිට 22 දක්වා සඳහන් තොරතුරු සම්පූර්ණ කර එවනු නො ලබන අපේක්ෂකයින්ගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත් නිවැරදි ව සම්පූර්ණ කර තිබේ ද යන්න අයදුම්පත

තැපැල් කිරීමට හෝ භාරදීමට පෙර නැවත පරීක්ෂා කර බලා තහවුරු කර ගන්නා ලෙස සියලු ම අපේක්ෂකයන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

- නියමිත දිනට පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත් 2025.05.11 දින හෝ එදිනට පෙර ලැබෙන සේ එවන ලෙස සියලු ම අයදුම්කරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

- පැවිදි/ගිහි ශිෂ්‍යයන්ට අවශ්‍ය නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ. ඒ පිළිබඳ ව වැඩි විස්තර නියෝජ්‍ය ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) මගින් විමසා දැනගත හැකි ය. නේවාසික සිසුන් නේවාසිකාගාර නීති රීති පිළිපැදිය යුතු ය.

- තෝරා ගනු ලබන සුදුසුකම් සපුරාලන පැවිදි/ගිහි පිරිමි ශිෂ්‍යයන්හට භාරකරුවන්ගේ ආදායම් තත්ත්වය මත මහපොළ හෝ ශිෂ්‍යාධාර ලබා දෙනු ඇත. මහපොළ / ශිෂ්‍යාධාර පිළිබඳ වැඩි විස්තර නියෝජ්‍ය ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) මගින් විමසා දැන ගත හැකි ය. මහපොළ/ශිෂ්‍යාධාර ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් නියමිත සුදුසුකම් සපුරාලිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පනවා තිබෙන නීතිරීතිවලට යටත් විය යුතු ය.

- ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු නියෝජ්‍ය ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) මගින් විමසා ලබා ගත හැකි ය.

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා අයදුම් කරනු ලබන අපේක්ෂකයන් අයදුම්පත් එවනු ලබන අවස්ථාව වන විට වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක (විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලයක/ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ/ අධ්‍යාපන විද්‍යා පීඨයක ආදී) ලියාපදිංචි වී සිටින බව අනාවරණය වුවහොත් ඔහුගේ ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු කරනු ලබන බව ද, ඒ සමඟ ඊට අදාළ සියලු වරප්‍රසාද අහිමි වන බව ද සියලු ම අයදුම්කරුවන් දත යුතු ය.

- 2026/2027 විශ්වවිද්‍යාලය ප්‍රවේශය සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලබන්නේ 2022, 2023, 2024 හෝ 2025 පැවති අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ය. සිසුහු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ නිර්ණායක අනුගමනය කරමින් සම්මුඛ පරීක්ෂණයකට ලක්කොට බඳවා ගැනෙති.

- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර 2026.05.11 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**අයදුම්පත එවිය යුතු ලිපිනය**

නියෝජ්‍ය ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා),
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
ගුරුළුගෝමී මාවත, පිටිපන උතුර,
හෝමාගම.

- ❖ අපේක්ෂකයන් ලියාපදිංචි කර ගනු ලබන්නේ ඔවුන්ගේ අධ්‍යාපන සහතිකපත් පරීක්ෂා කිරීමෙන් පසු ව බැවින් අයදුම්පතෙහි සඳහන් සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ට දන්වා යැවූ විට එම සහතික විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය බව සලකන්න. ඉන් පසු ව ලියාපදිංචි ගාස්තු ගෙවීම් පිළිබඳ ව දන්වා එවනු ලැබේ.

- ❖ අයදුම්පත සමඟ බැංකුවට මුදල් ගෙවන ලද බවට ලැබෙන කුවිතාන්සිය එවිය යුතු ය. අධ්‍යාපන සහතිකවල සහතික කල ඡායාපිටපත් අනිවාර්යයෙන් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

- ❖ අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම.

සෑම පෞද්ගලික අයදුම්කරුවෙක් ම පහත සඳහන් කවරෙක් හෝ ලවා තම අත්සන සහතික කරවා ගත යුතු ය.

පරිවේණාධිපතීන් වහන්සේ නමක්, විහාරාධිපතීන් වහන්සේ නමක්, ආගමික ස්ථානයක් භාර පූජකවරයෙක්, විදුහල්පතිවරයෙක්, ග්‍රාමසේවා නිලධාරිවරයෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක් හෝ වසරකට රු. 498,960/- කට නොඅඩු වැටුපක් ලබන රජයේ, පළාත් පාලන හෝ රාජ්‍ය සංස්ථා සේවාවක මාණ්ඩලික නිලධාරියෙක්.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 37, මොරගහහේන පාර,
පිටිපන,
හෝමාගම.
2026.04.07